සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# පෙරදිග සංගීතය

6 ශ්‍රේණිය

කාලය පැය 2 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- සියළුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.
- 1 සිට 5 දක්වා ඇති ප්‍රශ්න සඳහා හිස්තැනට අදාළ පහත දී ඇති වරණ අතරින් නිවැරදි පිළිතුර තෝරා ලියන්න.

01 මව්පිය ගුණ වර්ණනා ඇතුලත් ගීතයක් ලෙස ........................................................................ ගීතය, ළමා ගීතයක් ලෙස ද නම් කරයි.

02 කෙළි ගී වර්ග කිරීමේදී ........................................................................ යන ගීතය ඔළිඳ කෙළියෙහි එන ගීතයකි.

03 ........................................................................ යන ගීතය සී. දොන් බස්තියන් ශූරීන් මූලිකත්වය දැක්වූ නූර්ති නාට්‍ය සම්ප්‍රදායේ එන ගීතයකි.

04 වන්දනා ගමන් යාමේදී විශේෂයෙන් ........................................................ යන තුන් රසණේ ගීතය ගායනා කරනු ලබයි.

05 ස හා රි යන ස්වර දෙක පමණක් ඇසුරු කරගනිමින් නිර්මාණය වූ ........................................................................ යන ස්වරස්ථාපන ගීතය අප සංගීත පංතිකාමරයේදී ගායනා කරනු ලැබූවකි.

(මෙම ගිම්හාන ග්‍රීස්ම වූ කාලේ / සීත ගඟුලෙදි ඇඳ පේවෙනවා /ගී ගයන මේ කුරුළු යාළුවන් හා / දොඩම් කපාලා ඇඹුල් තනාලා / සුරතල් නංගියේ අපෙ අම්මා)

- 06 - 10 දක්වා ප්‍රශ්න සඳහා **A** කොටසට ගැළපෙන පිළිතුරු **B** කොටසින් තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| 06 | සාහිත්‍ය කලාව | නාද හා ස්වර |
| 07 | නර්තනය | අභිනය |
| 08 | නාට්‍ය කලාව | අංග චලන |
| 09 | සංගීතය | වර්ණ, රේඛා |
| 10 | චිත්‍ර කලාව | භාෂාව |

- 11 - 15 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති තොරතුරු හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුල යොදන්න.

11 ගායනයේදී කටහඬ ඇතිකිරීමට මෙන්ම හඬ පාලනයට හුස්ම ගැනීම හා පිට කිරීම ක්‍රමවත් බව ඇතිකර ගැනීම අත්‍යවශ්‍ය අංගයකි. (.........)

12 උතුරු ඉන්දීය සංගීතය හින්දුස්ථානී සංගීතය වශයෙන් ද, දකුණු ඉන්දීය සංගීතය කර්ණාටක සංගීතය වශයෙන් ද නම් කෙරේ. (.........)

13 අපේ කණට ඇසෙන හඬ මිහිරි නාද හා අමිහිරි ශබ්ද වශයෙන් වර්ග කරනුයේ නර්තන සම්ප්‍රදාය තුළ ය.

(.........)

14 රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ ලංකාගමනයෙන් පසු හොරණ ශ්‍රීපාලී විද්‍යායතනය හරහා සංගීත අධ්‍යාපනය ශ්‍රී ලංකාව තුළ ආරම්භ විය. (.........)

15 විදුලි ඕගනයෙන් ස්වර සප්තකය වාදනය කිරීමට නොහැකි ය. (.........)

- 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

16 සිදුරු 7ක් සහිත සංගීත භාණ්ඩය වන්නේ,

(1) සර්පිනාව (2) බටනලාව (3) මෙලෝඩිකාව (4) මවුත් ඕගනය

17 තාල වාදනය සඳහා වඩාත් සුදුසු සංගීත භාණ්ඩය මෙය වේ.

(1) සිතාරය (2) ගිටාරය (3) මැන්ඩලීනය (4) තබ්ලාව

18 බෝවක (BOW) ආධාරයෙන් වාදනය කරනු ලබන සංගීත භාණ්ඩ යුගලය වන්නේ,

(1) වයලීනය - එස්රාජය (2) සිතාරය - මැන්ඩලීනය

(3) ගිටාරය - දිල්රුබාව (4) තබ්ලාව - ග්ලොකන් ස්පිල්

19 සුළඟ ආධාරයෙන් නාදය උපදින ස්වර පුවරුවක් සහිත සංගීත භාණ්ඩය වන්නේ,

(1) බටනලාව (2) සර්පිනාව (3) සිතාරය (4) එස්රාජය

20 ලෝහයෙන් තනා ඇති ස්වර වාදනය කිරීමට හැකි ස්වර පුවරුවක් සහිත සංගීත භාණ්ඩය මින් කුමක් ද?

(1) සර්පිනාව (2) දිල්රුබාව (3) රෙකෝඩර් ෆ්ලූට් (4) ග්ලෝකන් ස්පීල්

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

01 ඔබ සංගීත පංතිකාමරයේදී රිද්ම රටා ප්‍රස්තාර කල අයුරු මතකයට නගා ගන්න.

(i) පහත දක්වා ඇති එක් එක් රිද්ම රටාවල බෙදී ඇති මාත්‍රා සංඛ්‍යාව සඳහන් කරන්න. (ල. 03)

A / XXX / XX- / XXX / XX- /

B / X--X /X- -X / XX-X /XX -X /

C / XX /-X / XX / -X /

(ii) හිස්තැන් පුරවන්න. (ල. 03)

A මේවා උච්ඡාරණය කිරීමට ගතවන කාලය එක් මාත්‍රාවක් වන අතර ගතවන කාලය කෙටියි. ඒවා ...................................................................... මාත්‍රා ලෙස හඳුන්වයි.

B උච්ඡාරණය කිරීමට ගතවන කාලය මාත්‍රා 03ක් වන අතර ඇදෙන අකුරක් හා හල් අකුරක් යෙදෙන විට ඒවා ....................................................................................... මාත්‍රා ලෙස හඳුන්වයි.

C මෙම අක්ෂර උච්ඡාරණය කිරීමට ගතවන කාලය මාත්‍රා දෙකකි. ඇදෙන අක්ෂරයක් නැතහොත් දීර්ඝ අක්ෂරයක් මේ සඳහා යොදාගනී. මෙම අක්ෂර ........................................................................ මාත්‍රා ලෙස නම් කරයි.

(iii) පහත ගී පාදයේ ලඝු, ගුරු, ප්ලුත මාත්‍රා වර්ගවලට අදාළ සංකේත අක්ෂරවලට යටින් දක්වන්න.(ල. 01)
මාත්‍රා වර්ග වෙන වෙනම ගණනය කර ලියන්න. (ල. 03)
''මේන්න වැන්දා රලහමී''

02 නරිබෑනා නාට්‍යයේ එන පහත සඳහන් ගී සඳහා පාදක කරගත් රබන් පද තෝරා නම් කරන්න. (ල. 03)

ගීත

| | |
|---|---|
| (අ) | තෝව දෙන්නෙත් නරියටයි |
| (ආ) | නරි නයිදෙගෙ කාලෙ හොඳයි |
| (ඉ) | ඇහැළ මලින් ගස් පිරිලා බලන්න හරි ලස්සනයි. |

රබන් පද

| | |
|---|---|
| (උ) | දුම් දුමටයි අඟුරු මොටයි. |
| (එ) | තෙලෙන් බැද්දත් කොබෙයියා |
| (ඔ) | අඹ රඹුටන් ගස් දෙක යට වලි කකුලන් පස් දෙනයි. |

(ii) මෙම නරිබෑනා නාට්‍යයේ නාට්‍ය නිෂ්පාදකවරයා සහ සංගීත නිර්මාණකරුවා නම් කරන්න. (ල. 02)

(iii) මෙම නාට්‍යයේ ඔබ උගත් (සම්පූර්ණ ගීතයම) ගීතයක් ලියන්න (ල. 05)

03 (i) ඔබ යොදාගත් ආදේශ සංගීත භාණ්ඩ පිළිබඳව අසා ඇති කරුණු ඔස්සේ පිළිතුරු සපයන්න. (ල. 04)

| | හඬ නිපදවූ අයුරු | යොදාගත් ආදේශ උපකරණ |
|---|---|---|
| I | ඇතිල්ලීමෙන් | ...................................................................................... |
| II | තැලීමෙන් | ...................................................................................... |
| III | පිඹීමෙන් | ...................................................................................... |
| IV | සෙලවීමෙන් | ...................................................................................... |

(ii) පහත දක්වා ඇත්තේ විවිධ අයුරින් ජලය පුරවාගත් වීදුරු කිහිපයකි. වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා ඉරක් ගසන්න. (ල. 03)



A B C

- A වීදුරුවට පැන්සලකින් තට්ටු කල විට ඇසුණු හඬ C වීදුරුවේ හඬට වඩා ( පහළ / ඉහළ ) හඬක් ලැබුණි.
- B වීදුරුවට තට්ටු කළ විට ඇසුණු හඬ A වීදුරුවේ හඬට වඩා ( පහළ / ඉහළ ) හඬක් ලැබුණි.
- C වීදුරුවේ ඇසුණු හඬ ඉතා ( පහළ / ඉහළ ) ය.

(iii) ඔබ සංගීත පන්තියේදී කළ ක්‍රියාකාරකම්වලදී යොදාගත් ආදේශ භාණ්ඩය නම් කර, එයින් හඬ උපදවාගත් ආකාරය කෙටියෙන් ලියන්න. (ල. 03)

04 (i) A හා B කොටස්වල හිස්තැන් සම්පූර්ණ කරන්න. (ල. 08)

| (A) | | | (B) | | |
|---|---|---|---|---|---|
| සඩ්ජය | - | ස | Do | - | C |
| ...................... | - | රි | Re | - | |
| ...................... | - | ග | Mi | - | |
| ...................... | - | ම | Fa | - | F |
| පංචමය | - | ප | So | - | |
| ධෛවතය | - | ධ | La | - | A |
| ...................... | - | නි | Ti | - | |

(ii) ඉහත දක්වා ඇති A කොටසේ හා B කොටසේ සංගීත සම්ප්‍රදායන් දෙක නම් කරන්න. (ල. 02)

05 පහත ස්වර අභ්‍යාස දෙක සම්පූර්ණ කරන්න. (ල. 10)






## පිළිතුරු පත්‍රය - I කොටස

01 සුරතල් නංගියේ 02 දොඩම් කපාලා 03 මෙම ගිම්හාන 04 සීත ගඟුලේදී 05 ගී ගයන මේ කුරුළු
06 භාෂාව 07 අංග චලන 08 අභිනය 09 නාද හා ස්වර 10 වර්ණ, රේඛා 11 ✓ 12 ✓
13 ✗ 14 ✓ 15 ✗ 16 II 17 IV 18 I 19 II 20 IV

## II කොටස

(20 x 2 = 40)

01 (i) A මාත්‍රා 3 න් 3
B මාත්‍රා 4 න් 4
C මාත්‍රා 2 න් 2 (ල. 03)
(ii) A ලඝු B ප්ලුත C ගුරු (ල. 03)
(iii) අදාළ පරිදි ලකුණු දෙන්න. (සංකේත සඳහා ල. 1 + මාත්‍රා ල. 3 = 4)
මේන් නු වැන්දා රලහමි ලඝු - 05, ගුරු - 02, ප්ලුත - 01

02 (i) අ - එ ඇ - උ ඉ - ඔ (ල. 03)
(ii) දයානන්ද ගුණවර්ධන - ලයනල් අල්ගම (ල. 02)
(iii) අදාළ පරිදි ලකුණු දෙන්න (ල. 05)

03 (i) අදාල පරිදි ලකුණු දෙන්න. (ල. 04)
(ii) A - පහළ ය. B - ඉහළ ය. C - ඉහළ ය. (ල. 03)
(iii) අදාළ පරිදි ලකුණු දෙන්න. (ල. 03)

04 (i) අදාළ පරිදි ලකුණු දෙන්න. (A ලකුණු 4, B - ලකුණු 4 = 8)
(ii) පෙරදිග සංගීත සම්ප්‍රදාය - අපරදිග සංගීත සම්ප්‍රදාය (ල. 02)

05 (i) අදාළ පරිදි ලකුණු දෙන්න. (A ලකුණු 5, B - ලකුණු 5 = 10)